**AHEAD මෙහෙයුම්**

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## ලංසු සඳහා ආරාධනය (IFB)

## ඉගැන්වීම් සහ කාර්යාලයීය උපකරණ සැපයීම

---

**IFB NO: AHEAD/CITIES/OUSL/NCB/GOODs/2022/01**

1. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය AHEAD මෙහෙයුම් වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති (විශ්වවිද්‍යාලය) විසින් පහත දැක්වෙන විස්තරවලට අනුව ඉගැන්වීම් සහ කාර්යාලයීය උපකරණ සැපයීම, බෙදාහැරීම, සවි කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු සඳහා ආරාධනා කෙරේ.

| Item No | Name of the Items | No of Units | Bid Security (SLRS) |
|---|---|---|---|
| 1 | High-End Laptop Computers. | 43 | 240,800.00 |
| 2 | High-End Laptop Computers with a dedicated graphic card. | 07 | 42,000.00 |
| 3 | Smart Digital Panel | 12 | 144,000.00 |
| 4 | Video Conferencing Systems (Camera, Mic, Speakers etc.)- | 09 | 90,000.00 |
| 5 | Headset for computers. | 385 | 34,400.00 |
| 6 | Headset for computers for video recording of lecturers. | 25 | 6,000.00 |

2. සෑම ලංසුවක්ම ඉහත වගුවේ දක්වා ඇති මුදල සඳහා මෙම ලංසු ලේඛන සමග ලබා දී ඇති ආකෘතිය පරිදි බැංකු ඇපකරයක් ආකාරයෙන් ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් මගින් බැංකු ඇපකරය ලබා ගත යුතු වේ. ලංසු ඇපකරය ඉල්ලුම මත කොන්දේසි විරහිත විය යුතු අතර **2022/06/15** දක්වා වලංගු විය යුතුය.

3. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියා පටිපාටියට අනුකූලව සිදු කෙරේ.

4. ඉහත සඳහන් උපකරණ සැපයීම, බෙදා හැරීම, සවි කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවම වශයෙන් **වසර 03 ක** පළපුරුද්ද සහිත රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනවලට සමාන ප්‍රමාණවලින් ඇණවුම් සපයා ඇති ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කළ හැකි ය.

5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රසම්පාදන, AHEAD මෙහෙයුම්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය (දු.කඃ 011-2881127/ 011-2881212) වෙතින් ලබා ගත හැකි අතර ලංසු ලේඛන පරීක්ෂා කිරීම කාර්යාලයීය වේලාවන් තුළ දී නොමිලේ එම ස්ථානයේදීම සිදු කරගත හැකි ය.

6. සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් ඉංග්‍රීසි භාෂාවෙන් ලබා ගැනීම සඳහා මෙයට උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රසම්පාදන, AHEAD මෙහෙයුම්, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මගින් හා **2022/02/07** සිට **2022/02/28** දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා විශ්වවිද්‍යාලයේ සරප් වෙත ආපසු නොගෙවනු ලබන රු.3,500ක ගාස්තුවක් ගෙවීම මගින් මිළදී ගත හැක. ලංසු ලේඛන www.ou.ac.lk. විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් පරික්ෂා කළ හැකි ය.

7. ඉහත ටෙන්ඩරය සඳහා ලංසු ලේඛන www.ou.ac.lk. විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කළ හැක. විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් ලංසු ලේඛන ලබා ගන්නා අය ආපසු නොගෙවනු ලබන රු.3,500ක ගාස්තුවක් ගෙවා "මූල්‍යාධිකාරී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය" නමට ලියන ලද බැංකු අණකරයක් සමඟ ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතු වේ.

8. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ලංසු වෙන වෙනම ලියුම් කවර වල "මුල් පිටපත" සහ "අනු පිටපත" ලෙස ලකුණු කර තවත් මුද්‍රා තබන ලද ලියුම් කවරයකට නැවත ඇතුළත් කර ලියුම් කවර තුනෙහිම වම්පස ඉහල කෙලවරෙහි කොන්ත්‍රාත්තුවේ නම සහ කොන්ත්‍රාත් අංකය සඳහන් කර "සභාපති, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව (විශ්වවිද්‍යාලය), AHEAD මෙහෙයුම්, සැපයුම් අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය. අනු පිටපත මුල් පිටපතෙහි සහතික කරන ලද පිටපතක් විය යුතුය.

9. ඉහත සඳහන් ලිපිනයට **2022/03/02** දින ප.ව 2.00ට හෝ ඊට පෙර ලංසු ඉදිරිපත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම සිදු කරන අතර ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයන්ට මෙම අවස්ථාවට සහභාගී විය හැකි ය.

10. පූර්ව ලංසු රැස්වීමක් **2022/02/17** දින පෙ.ව 10.00ට Zoom තාක්ෂණය හරහා පැවැත්වේ.

11. ලංසු පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

සභාපති,
ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව (විශ්වවිද්‍යාලය),
AHEAD මෙහෙයුම්,
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය,
නාවල, නුගේගොඩ.